# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2458/43 - 2025 ඔක්තෝබර් මස 15 වැනි බදාදා - 2025.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2025 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. වරින් වර සංශෝධනය කරන ලද, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2025 ඔක්තෝබර් මස 10 දිනැති අංක 25/1942/817/013-XV දරන ඒකාබද්ධ සංදේශය පිළිබඳව වූ 2025 ඔක්තෝබර් මස 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි පනවනු ලැබේ.

4. 2025 අප්‍රේල් මස 29 දිනැති අංක 2434/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2025 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් සංශෝධනය කරන ලද 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *ගැසට් පත්‍රයේ*

ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල කෙසේ සඳහන් වුව ද, 2025 ඔක්තෝබර් මස 15 සහ 2025 ඔක්තෝබර් මස 28 අතර කාලය තුළ නැව්ගත කරන ලද **සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය කර ඇති කීරි සම්බා සහල් වලට සමාන වන GR 11/පොන්නි සම්බා සහල්** තොග ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව මෙයින් නිදහස් කරනු ලැබේ.

කෙසේ වෙතත්, මෙම රෙගුලාසි යටතේ, එක් ආනයනකරුවෙකුට කීරි සම්බා සහල් වලට සමාන වන GR 11/පොන්නි සම්බා සහල් උපරිම ප්‍රමාණය මෙට්‍රික් ටොන් 520ක් පමණක් එම සහල් තොගවල නෞභාර පත්‍රයේ නැව්ගත කිරීමේ දිනය 2025 ඔක්තෝබර් මස 15 සහ 2025 ඔක්තෝබර් මස 28 අතර දිනයක් සහිතව ආනයනය කිරීමට අවසර දෙනු ලැබේ.

5. ඉහත රෙගුලාසි අංක 4හි සඳහන් සහල් තොග 2025 නොවැම්බර් මස 15 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගත යුතු ය.

6. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත හෝ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

7. මෙම රෙගුලාසි 2025 ඔක්තෝබර් මස 15 දින සිට බලාත්මක වේ.

EOG 10 - 243

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.